# 5 දේව බලය තුළින් පෝෂණය

ශු. මාක් 8 : 1-10

**ස්වාමීන් වහන්සේ මාගේ එඬේරාණෝ ය**
**අඟ හිඟ මට නොවන්නේ ය.**

ඉහත ශුද්ධ ලියවිලි පාඨය අපට සිහිපත් කරවන වැදගත් සත්‍යතාව වන්නේ, දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය පෝෂකයාණන් බව ය. උන්වහන්සේ ඒ බව සනාථ කළ අවස්ථා පැරණි ගිවිසුමේ බෙහෙවින් දකින්නට ලැබේ. පාළුකරයේ දී ඉශ්‍රායෙල් ජනයාට පෝෂණය ලබා දීම, එලියා දිවැසිවරයා ශාරෙපත්හි වැන්දඹු ස්ත්‍රිය මගින් හා කපුටන් මගින් පෝෂණය කිරීම ඉන් කිහිපයකි.

එමෙන් ම අප නව ගිවිසුම දෙස බැලීමේ දී ජේසුස් වහන්සේ සිය මෙහෙවරේ දී ජනතාව පෝෂණය කිරීම සඳහා විවිධ ප්‍රාතිහාර්ය සිදුකළ බව පෙනී යයි. පහත දැක්වෙන්නේ එවැනි එක් ප්‍රාතිහාර්යයකි.



**විමසා බලමු**
ශු.මාක් 8 : 1 - 10

**සම්බන්ධ වූ පිරිස** → හාරදහසක් පමණ වූ විශාල ජනතාවකි. ඔවුන් අතර විවිධ වයස් කාණ්ඩයන්ට අයත් පුද්ගලයන් සිටි බව සැලකේ. ජුදෙව් ජනයා මෙන් ම, විවිධ ජාතීන්ට අයත් ස්ත්‍රී, පුරුෂ, වැඩිහිටි, දරුවන් යන විවිධ ජනතාවක් එහි සිටි බව පැවසේ.

**රැඳී සිටි කාලය** → දින තුනක් ඔවුන් ජේසුස් වහන්සේගේ දේශනා අසමින් උන්වහන්සේ සමග ඉවසීමෙන් රැඳී සිටි බව සඳහන් වේ.

**මුහුණ දුන් පොදු ගැටලුව** → දින තුනක් නොකඩවා ඔවුන් ජේසුස් වහන්සේගේ දේශනාවලට සවන් දෙමින් සිටි හෙයින් සෙනඟට කෑමට කිසිවක් ලබාදීම.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙලෙස මෙම පිරිස දින තුනක් පුරා ජේසුස් වහන්සේගේ වදන්වලට සවන් දෙමින් ආධ්‍යාත්මික වශයෙන් තෘප්තිමත් වූහ. ඔවුන්ගේ ආධ්‍යාත්මික අවශ්‍යතාව තම ඉගැන්වීම් මගින් සංසිඳුවාලූ ජේසුස් වහන්සේ ඔවුන් පෙළුණාවූ ශාරීරික අවශ්‍යතාව ද හඳුනාගත් සේක.

ඔබේ ජීවිතයේ කෙදිනක හෝ ආධ්‍යාත්මික සත්‍යතා දැන ගැනීම සඳහා දේව වචනය ඉගෙන ගැනීමට දැඩි වුවමනාවක් ඔබට ඇතිවිණි ද? ඒ උදෙසා ලෞකික ජීවිතයේ අවශ්‍යතා අභිබවා උන්වහන්සේ සමග රැඳී සිටීමට ඔබට හැකි ද?

දින තුනක් පුරාවට උන්වහන්සේගේ දේශන අසමින් රැඳී සිටි ජනතාවගේ ශාරීරික අවශ්‍යතා හඳුනාගත් ජේසුස් වහන්සේ,

- කනගාටු වූ සේක
- ඔවුන්ගේ ශාරීරික අවශ්‍යතා අවබෝධ කර ගත් සේක
- දයානුකම්පාවෙන් ඔවුන්ගේ ගැටලුවට මැදිහත් වූ සේක.

ශ්‍රාවකයන් සමග සාකච්ඡාවෙන් ගැටලුවට විසඳුම් සෙවීමට උන්වහන්සේ උත්සාහ දැරූ සේක. එතරම් පිරිසකට, පාළුකරයක ආහාර සපයා ගැනීමේ අපහසුතාව ශ්‍රාවකයන් විසින් පෙන්වා දෙන ලදි. විසඳුමක් සඳහා ශ්‍රාවකයන් සතු ව තිබුණේ කුමක් ද යන පැනය උන්වහන්සේ විමසූ සේක. ඔවුන් ළඟ රොටි හතක් හා කුඩා මසුන් ස්වල්පයක් පමණක් තිබූ බව සඳහන් වේ.

උන්වහන්සේට එක් මොහොතකින් ප්‍රාතිහාර්යාත්මක විසඳුමක් දීමට හැකියාව තිබුණ ද උන්වහන්සේ ශ්‍රාවකයන් ද ඒ සඳහා සම්බන්ධ කර ගැනීමට ක්‍රියා කළ සේක. ගැටලුවට විසඳුම් සෙවීමට උන්වහන්සේ ප්‍රයත්න දැරුවේ ශ්‍රාවකයන් ජනතාවගේ අවශ්‍යතාව දැකීමට යොමු කරමිනි.

මෙලෙස මිනිසාගේ ගැටලුවලට මිනිස් බුද්ධියෙන් ළඟා කරගත නොහැකි ප්‍රාතිහාර්යාත්මක විසඳුමක් ලබාදීමට උන්වහන්සේ ඉදිරිපත් වූ සේක.

ජේසුස් වහන්සේ විසින් මෙම ප්‍රාතිහාර්ය සිදු කළ ආකාරය දෙස දැන් අපි යොමු වෙමු.

- උන්වහන්සේ සමූහයාට බිම හිඳගන්නට සැලැස්වූ සේක
- රොටි හත ගෙන දෙවියන් වහන්සේට තුති පිදූ සේක
- අනතුරුව රොටි හත කැඩූ සේක



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- රොටි හත ජනතාවට පිළිගැන්වීමට ශ්‍රාවකයන්ට භාර දුන් සේක
- එසේ ම ඔවුන් ළඟ තිබූ කුඩා මසුන් ස්වල්පයට ද ආශීර්වාද කොට එය ද සමූහයා වෙත බෙදා දීමට ශ්‍රාවකයන්ට පැවසූ සේක.

එසේ ම එම ප්‍රාතිහාර්යාත්මක සිදුවීම පිළිබඳ ව දේව වචනය තව දුරටත් මෙලෙස සඳහන් කරයි.

*"ඔවුහු ද කා තෘප්තියට පැමිණියහ. ඉතිරි වූ කැබලි එක්කොට කුඩා හතක් පුරවා ගත්හ. එහි සෙනඟ හාරදහසක් පමණ වූහ"* (මාක් 8:8-9)

ජේසුස් වහන්සේ මිනිස් අවශ්‍යතා දැක හඳුනාගෙන ඒවා සැපිරීමට මහත් ප්‍රාතිහාර්ය සිදු කළ අතර, හාර දහසකට කන්නට දීමේ මෙම ප්‍රාතිහාර්යය තුළ අපගේ ජීවිතවලට ගෙනෙන මඟ පෙන්වීම් මොනවා ද යන්න දැන් විමසා බලමු.

- ජේසුස් වහන්සේ දේව පුත්‍රයාණන් නිසා උන්වහන්සේ මිනිස් සීමාවලින් ඔබ්බට ගොස් මහත් හාස්කම් සිදු කළ සේක. ශුභාරංචි කියවීමේ දී හා ඔබගේ ම පෞද්ගලික ජීවිතයේ අත්දැකීම්වලින් එය ඔබට හඳුනා ගත හැකි ය. එම නිසා මේ ආදරණීය බලවත් සමිඳාණන් දෙස ඇදහිල්ලෙන් බලමු.

- උන්වහන්සේ මිනිස් අවශ්‍යතා නියම ලෙසට හඳුනා ගන්නා සේක. එසේ ම මිනිසාගේ අසීරු තත්ත්ව පිළිබඳ ව කනගාටුවට පත්වන සේක. ජේසුස් වහන්සේ සිදු කළ මෙම ප්‍රාතිහාර්යය තුළ මනුෂ්‍යයා පිළිබඳ ව උන්වහන්සේ දක්වන සංවේදී බව මනා ව පිළිබිඹු වෙයි. මිනිසාගේ ආධ්‍යාත්මික පෝෂණය මෙන් ම ශාරීරික පෝෂණය ගැන උන්වහන්සේ අවධාරණයෙන් සිටින සේක. මිනිසාගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට උන්වහන්සේ ඉදිරිපත් වන සේක. අපගේ ජීවිත ගැටලුවල දී, උන්වහන්සේ මැදිහත් වන බව විශ්වාස කරමු.

- ජේසුස් වහන්සේ මෙම ප්‍රාතිහාර්යය සිදු කිරීමේ දී ශ්‍රාවකයන්ගේ සහභාගිත්වය ද ඒ සඳහා යොදා ගත් සේක. ප්‍රාතිහාර්යය සිදු කරන්නේ උන්වහන්සේ ය; නමුත් එහි යම් යම් අවස්ථා සඳහා ශ්‍රාවකයන්ට දායක විය හැකි විය. සමිඳාණන් වහන්සේ ප්‍රාතිහාර්ය සිදු කිරීම සඳහා අප ද සහභාගි කර ගන්නා සේක. ඇදහිල්ලෙන්, උන්වහන්සේගේ අණට කීකරු වීමෙන් ඔබට ද උන්වහන්සේගේ මහත් බලය අත්දැකිනු හැකි වේ.

- සැම දෙනා කෙරෙහි දයානුකම්පාව දැක්වීමට ද, ගැටලු සහගත අවස්ථාවල දී එක් ව දෙවිඳුන් පාමුලට පැමිණීමට ද ඔබ උනන්දු වීම අවශ්‍ය ය. ජේසුස් වහන්සේ ජනතාව ගැන සංවේදී වූයේ යම් සේ ද, එලෙසින් සමාජයේ අවශ්‍යතා උදෙසා සංවේදී වීමට අපට අභියෝගයක් තිබේ.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- මෙම සෙනගගේ අධ්‍යාත්මික හා ශාරීරික අවශ්‍යතා උන්වහන්සේ සැපිරූ සේක. දේව වචනය කියවමින්, දෙවිඳුන්ට සවන් දෙමින්, ආධ්‍යාත්මික ව ශක්තිමත් ව උන්වහන්සේ ළඟ රැඳී සිටීමට අවශ්‍ය වේ. ජීවිතයේ සියලු අවශ්‍යතා ඔබට සලසා දෙන්නේ උන්වහන්සේ ය.

- එම නිසා උන්වහන්සේ වෙතට ඇදහිල්ලෙන් පැමිණෙමු. උන්වහන්සේගෙන් පෝෂණය වෙමු. ලෝකය තුළ බලවත් දේ සිදු කිරීමට උන්වහන්සේට හැකි බව විශ්වාස කරමු.

**ක්‍රියාකාරකම්**

1. ඔබ භාරදහසකට කෑම දීමේ සිදුවීමට සම්බන්ධ වූ අයකු යැයි සිතා එම සිදුවීම ඔබේ වචනයෙන් විස්තර කරන්න.
2. භාරදහසකට කෑම දීමේ සිදුවීමෙන් ජීවිතයට ලද හැකි අත්දැකීම් **පහක්** ලියන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.